# මූලික පිරිවෙන් පළමුවාර පරීක්‍ෂණය - 2019

# 02 වසර - Grade 02

# සිංහල

**කාලය පැය:02**

---

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් **එකක්** තෝරාගෙන වචන 100 කට නො අඩු රචනයක් ලියන්න.

vii. මගේ රට

viii. වෙසක් උත්සවය

ix. මව්පිය උපස්ථානය

x. මිහිඳු මාහිමි

xi. සමගිය බලය වේ.

(ලකුණු 20)

02. (අ) සිංහල හෝඩියේ ස්වර අක්ෂර කීයද ? ඒවා ලියා දක්වන්න.

(ලකුණු 05)

(ආ) හිස්තැන් පුරවන්න.

i. ත් + ............ = තා　　ii. ............+ ඊ = පී

iii. ග්+ ..........= ගෝ　　iv. ස් + ............. = සූ

v. ම් + ......... = ඕ

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් වචන අකාරාදි පිළිවෙලට ලියන්න.

ජපානය, තායිලන්තය, ඉන්දියාව, නේපාලය, චීනය, ලන්ඩනය, ඇමරිකාව

(ලකුණු 05)

03.(අ) පහත සඳහන් වචනවල අක්‍ෂර වින්‍යාසය නිවැරදි කර ලියන්න.

පුස්ථකාලය,විහාරස්තානය, ධර්මිශ්ඨ, චන්ද්‍රය ,ඥානය

(ලකුණු 05)

(ආ) පහත සඳහන් නාම පද ඇසුරින් ජාති , ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා, නාම පද වෙන්කර දක්වන්න.

උස මිනිසා, නටන්නා, අලියා, සමීර, මේසය

(ලකුණු 05)

(ඇ) සිංහල භාෂාවේ ලිංග කීයද? ඒවා ලියා දක්වන්න.

(ලකුණු 05)

04. (අ) '' වඳුරු '' ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

(ලකුණු 05)

(ආ) නිපාත යනු කුමක්දැයි, හඳුන්වා නිපාත පද 03 ක් ලියන්න.

(ලකුණු 05)

05. (අ) සුදුසු ක්‍රියා පද වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

vi. ගොවියෝ වෙහෙස වී කුඹුරු ............................ ( කොටයි. / කොටති. )

vii. අපි පන්සලට ගොස් වීනීතව...................... ( හැසිරෙමි. / හැසිරෙමු. )

viii. තොපි නිති පන්සිල් ........................ ( රකිති./ රකිහු. )

ix. අම්මා පොළට ...................... ( ගියේය. / ගියාය. )

x. උපාසක මහතා හෙට විහාරයට ................................ ( යන්නේය./ යන්නෝය.)

(ලකුණු 10)

(අ) සිදත් සඟරාවේ '' උපසර්ග '' පද කීයද? එම පද යෙදෙන වචන 03 ක් ලියන්න.

(ලකුණු 05)

06. (අ) '' පහළ පොරණ ඉසිවර මුවෙනි මන නඳ '' මෙම කවිය සම්පූර්ණ කර එහි අර්ථය ලියන්න.

(ලකුණු 05)

(ආ) '' අලගියවන්න මුකවෙට්ටිතුමා විසින් රචිත සුභාෂිතය මගින් අපට ගතහැකි ආදර්ශ රැසක් පෙන්වා දෙන්න. (ලකුණු 10)

07. (අ) '' අග රජ සුර රජ මුනි රජ වඳනින් '' මෙම කවිය සම්පූර්ණ කරන්න

(ලකුණු 05)

(ආ) ගණ දෙවි හෑල්ලේ ඔබ උගත් කවි දෙකක් ලියන්න

(ලකුණු 10)

08. ටී.බී. ඉලංගරත්න සූරීන් විසින් රචිත '' අඹයහළුවෝ '' නවකතාවේ ඔබ සිත් ගත් චරිතයක් නම් කර විස්තර කරන්න. (ලකුණු 15)